සියලු ම හිමිකම් ඇවිරිණි]

8035

## පාසල පදනම් කරගත් ඇගයීම සහ වාර පරීක්ෂණ ඒකාබද්ධ කිරීමේ නියාමක ව්‍යාපෘතිය
## බස්නාහිර පළාත සහ වයඹ පළාත

**6 ශ්‍රේණිය - පළමුවන වාර පරීක්ෂණය - 2008**

කාලය මිනිත්තු 30 යි

**ගණිතය - I පත්‍රය**

විභාග අංකය: .......................

* ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයෙහි ම පිළිතුරු සපයා **II** පත්‍රයෙහි උත්තර පත්‍රයට අමුණන්න.

1. පහත දැක්වෙන ද්‍රව්‍ය අතුරෙන් වෘත්ත හැඩ තෝරා යටින් ඉරි අඳින්න.

   වළල්ල, රුපියලේ කාසිය, දොර පියනක මුහුණත, කොස් කොළය

2. 358 732 යන සංඛ්‍යාවේ 7 ඉලක්කමෙන් නිරූපණය වන අගය කීය ද?

3. 12 හි ආකල බන්ධනයක් ලබාගැනීම සඳහා සුදුසු සංඛ්‍යා යොදා හිස්තැන් පුරවන්න.




4. සුළු කරන්න : 295 + 5328 + 25

5. පන්ති කාමරයේ දී වෘත්ත රටා ඇඳීම සඳහා ඔබ භාවිත කළ ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

   (i) ....................................... (ii) .......................................

6. පාසලක සිසුහු 600 ක් සිටිති. එක්තරා දිනයක නොපැමිණි සිසුන් සංඛ්‍යාව 28 කි. එදින පැමිණි සිසුන් සංඛ්‍යාව කීය ද?

7. දී ඇති සංඛ්‍යාවේ කලාපවල නම් හිස්තැන්වල ලියන්න.




8. සුළු කරන්න : $45 \times 23$

9. 6 වන ශ්‍රේණියේ ගණිතය විෂයයට අදාළ කණ්ඩායම් ක්‍රියාකාරකමක් පෙ.ව. 11.30 ට ආරම්භ වී ප.ව. 12.05 ට අවසන් විය. ඒ සඳහා ගත වූ කාලය මිනිත්තු කීය ද?

10. සුළු කරන්න : $800 \div 80$

[දෙවන පිටුව බලන්න.

11. අජිත්ගේ වයස අවුරුදු 8 කි. ගනේෂ්ගේ වයස අවුරුදු 11 කි.

දී ඇති සංඛ්‍යා රේඛාවේ මෙම තොරතුරු ලකුණු කරන්න.




12. 5, 9, 13 යන සංඛ්‍යාවලින් සුදුසු සංඛ්‍යාව බැගින් යොදා ගනිමින් හිස්තැන් පුරවන්න.

(i) 9 < …  (ii) 9 > …

13. එක්තරා නගර දෙකක් අතර දුර 70 km ට වඩා වැඩි ය. එම දුර ආසන්න 10 km ට වටයූ විට ලැබුනේ 70 km ය. නගර දෙක අතර නියම දුර විය හැකි

(i) **වැඩිම** km ගණන .................  (ii) **අඩුම** km ගණන .................

14. රූපයේ දැක්වෙනුයේ කැබලි මෝස්තර නිර්මාණයකි. එහි




(i) *a* වලින් දක්වා ඇත්තේ කුමන වර්ගයේ කෝණයක් ද? ..............................

(ii) පරාවර්ත කෝණයක් දක්වා ඇත්තේ කුමන සංකේතයෙන් ද? ................

15. නිර්මිත පරිසරයේ සෘජුකෝණ දක්නට ලැබෙන අවස්ථා **දෙකක්** ලියන්න.

(i) ....................................

(ii) ....................................

To download past papers visit
www.vajirapani.blogspot.com

16. අමල්ගේත් සවිත්‍රිගේත් ස්කන්ධ පිළිවෙළින් 38 kg සහ 42 kg වේ. එම ස්කන්ධ, ආසන්න දහයට වටයා හිස්තැන් පුරවන්න.

අමල්ගේ ස්කන්ධය = ...... kg (ආසන්න දහයට)

සවිත්‍රිගේ ස්කන්ධය = ...... kg (ආසන්න දහයට)

17. (i) දිශාව නිශ්චය කිරීම සඳහා භාවිත කෙරෙන උපකරණයක් නම් කරන්න. ..................

(ii) එහි දර්ශකය යොමු වී ඇත්තේ කවර දිශාවට ද? ............

18. (i) මෙම රූපයේ අඳුරු කර ඇති කොටස භාගයක් ලෙස ලියා දක්වන්න.



(ii) මෙම රූපයෙන් $\frac{5}{6}$ ක් අඳුරු කර දක්වන්න.



19. සුළු කරන්න : $\frac{1}{10}+\frac{3}{10}$

20. 'තිරස්' හා 'සිරස්' යන වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.

පන්ති කාමරයේ.......................... බිමට ලම්බ ව .......................... බිත්තිය පිහිටයි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]

## පාසල පදනම් කරගත් ඇගයීම සහ වාර පරීක්ෂණ ඒකාබද්ධ කිරීමේ නියාමක ව්‍යාපෘතිය
## බස්නාහිර පළාත සහ වයඹ පළාත

## 6 ශ්‍රේණිය - පළමුවන වාර පරීක්ෂණය - 2008

## ගණිතය - II පත්‍රය

පැය එකයි මිනිත්තු තිහයි

* **පළමුවන** ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු සපයන්න.

* පළමුවන ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද ලැබේ.

**1.** ඔබේ ගණිත ගුරුතුමාගේ/ගුරුතුමියගේ මග පෙන්වීම යටතේ ඔබ සකස් කළ, **ආහාර පරිභෝජනය පිළිබඳ වියදම් වාර්තාව** සිහිපත් කරගන්න.

(i) වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගත්තේ කුමන ස්ථානයකින් ද?

(ii) එම තොරතුරු ලබාගැනීමට ඔබට සහය වූ අයකු නම් කරන්න.

ආහාර පරිභෝජනය පිළිබඳ වාර්ෂික වියදම් වාර්තා දෙකකින් උපුටාගත් තොරතුරු පහත දක්වේ.

| ද්‍රව්‍යය | අනිල්ගේ පවුලේ වියදම | පියල්ගේ පවුලේ වියදම |
|---|---|---|
| (1) සහල් | රුපියල් 50 400 | රුපියල් 43 200 |
| (2) පාන් | රුපියල් 12 000 | රුපියල් 24 000 |

(iii) පවුල් දෙක සහල් සඳහා වැය කරන මුදල්, < සංකේතය යොදා සන්සන්දනය කරන්න.

(iv) පවුල් දෙකට ම පාන් සඳහා වැයවන මුළු මුදල සොයන්න.

(v) ඉහත (iv) හි ලබාගත් මුදල 2 න් බෙදීමෙන්, එක් පවුලකට පාන් සඳහා වැයවන සාමාන්‍ය මුදල සොයන්න.

(vi) ඉහත (v) හි ලබාගත් පිළිතුර ඇසුරෙන්, පවුල් 4000 ක් පාන් පරිභෝජනය සඳහා වර්ෂයකට වැය කරන සාමාන්‍ය මුදල සොයන්න.

(vii) ඉහත (vi) හි ලබාගත් අගය සම්මත ආකාරයෙන් ලියන්න.

(viii) පාන් නිපදවීමට අවශ්‍ය පිටි, ආනයනය කරනු ලැබේ. ඒ සඳහා වැයවන මුදල ඉතිරි කර ගැනීම සඳහා ඔබට ඉදිරිපත් කළ හැකි යෝජනා **දෙකක්** ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

**2.** මෙම සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.




(i) ළිඳ පිහිටියේ ක්‍රීඩාගාරයට කුමන දිශාවෙන් ද?

(ii) ක්‍රීඩාගාරයට ගිනිකොන දිශාවෙන් පිහිටියේ කුමක් ද?

(iii) ගේට්ටුව පිහිටියේ ක්‍රීඩාපිටියේ සිට
 (a) කුමන දුරකින් ද?
 (b) කුමන දිශාවකින් ද?

(iv) එදිනෙදා ජීවිතයේ දී දිශා පිළිබඳ ව දැනගැනීම වැදගත් වන අවස්ථා **දෙකක්** ලියන්න.

[දෙවන පිටුව බලන්න.

**3.** වගුවෙහි දක්වෙන තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| ප්‍රශ්න පත්‍රය | ආරම්භ වන වේලාව | අවසන් වන වේලාව |
|---|---|---|
| විද්‍යාව I කොටස | පෙ.ව. 10.00 | පෙ.ව. 10.30 |
| විද්‍යාව II කොටස | පෙ.ව. 11.00 | ප.ව. 1.00 |

(i) විද්‍යාව I කොටස ආරම්භ වන වේලාව හා අවසන් වන වේලාව පිළිවෙළින් ලියා දක්වන්න.

(ii) විද්‍යාව II කොටස සඳහා වෙන් කර තිබූ කාලය කොපමණ ද?

(iii) විද්‍යාව II කොටස අවසන් වන වේලාව, සම්මත වේලාවෙන් ලියන්න.

(iv) නිමල්, විද්‍යාව II කොටසට පිළිතුරු ලිවීම ප.ව. 12.45 ට අවසන් කළේ නම්, ඒ සඳහා ඔහුට ගතවූ කාලය කොපමණ ද?

**4.** සිසුන් පස්දෙනකු පරීක්ෂණයක දී ලබාගත් ලකුණු සංඛ්‍යා රේඛාවෙහි දක්වේ.




(i) **වැඩිම** ලකුණු ලබා ඇත්තේ කවුද?

(ii) **අඩුම** ලකුණු ලබා ඇත්තේ කවුද?

(iii) සමාන ලකුණු ලබා ඇති **දෙදෙනා** නම් කරන්න.

(iv) සුමුදු, අමාලිට වඩා ලකුණු කීයක් වැඩිපුර ලබා ඇත් ද?

(v) > සංකේතය යොදා අමාලිගේ සහ මොහාන්ගේ ලකුණු සන්සන්දනය කරන්න.

(vi) අමාලි ලබාගත් ලකුණු මෙන් දෙගුණයක් ලකුණු ලබා ඇත්තේ කවුද?

To download past papers visit
www.vajirapani.blogspot.com

**5.** පහත රූප සටහනෙහි විවිධ වර්ගයේ කෝණ 8ක් *A* සිට *H* තෙක් අක්ෂරවලින් නම් කර ඇත.




(i) සුළු කෝණ **දෙකක්** නම් කරන්න.

(ii) මහා කෝණ **දෙකක්** නම් කරන්න.

(iii) *C* මගින් දක්වා ඇත්තේ කුමන වර්ගයේ කෝණයක් ද?

(iv) *D* මගින් දක්වා ඇත්තේ කුමන වර්ගයේ කෝණයක් ද?

(v) උතුරට හැරී සිටි අයකු දකුණට හැරීමේ දී එම භ්‍රමණයෙන් සෑදෙන්නේ කුමන වර්ගයේ කෝණයක් ද?
රූපයේ ඇති එවැනි කෝණයක් නම් කරන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

**6.** (a) $\frac{2}{3}$ට තුල්‍ය භාග **දෙකක්** ලියන්න.

(b) පහත දැක්වෙන භාග අතුරෙන් **ඒකක භාග** තෝරා ලියන්න.

$\frac{2}{3}, \frac{1}{5}, \frac{5}{7}, \frac{3}{5}, \frac{1}{2}, \frac{1}{7}, \frac{3}{4}, \frac{1}{4}$

(c) මෙම භාග **ආරෝහණ** පටිපාටියට පිළියෙල කර ලියන්න.

$\frac{3}{7}, \frac{3}{4}, \frac{3}{5}$

(d) සුළු කරන්න: $\frac{5}{9} - \frac{1}{3}$

To download past papers visit
www.vajirapani.blogspot.com

**7.** (a) සුළු කරන්න :

(i) $1500 \times 10$

(ii) $32 \times 0$

(iii) $10999 + 9$

(iv) $308 \div 14$

(b) ආසන්න දහයට වටයා ලියන්න :

(i) 754

(ii) 755

(iii) 795

* * *